# සංස්කෘතිය විකිණීම ඔස්සේ ඉන් ඈත්වීම

අප අපේ සංස්කෘතියෙන් වෙන් වූ කල, එනම් සංස්කෘතිය අපෙන් වෙන් කළ විට, අපට සංස්කෘතිය අළෙවි කිරීමට මෙන් ම මිළ දී ගැනීමට ද හැකි ය. තරු පහේ හෝටලයක බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අනුකූලව සිරිත් විරිත් අනුගමනය කරන අතරම එහි ඇති ඊනියා ගමේ කඩෙන් ඉතා ඉහළ මිළක් ගෙවා ඇඹුල් තියල් හා කොස් සමග බත් අනුභව කරන්නා සංස්කෘතිය මිළ දී ගන්නෙකි. ඔහු කඩෙන් ඇඳුමක් මිළ දී ගන්නාක් මෙන් ඊනියා ගමේ කඩෙන් සංස්කෘතික කෑම වේළක් මුදලට ගනියි.

අවාසනාවකට වැඩිපුර බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ජීවත්වන බොහෝ අය මේ සංස්කෘතිය විකිණීමේ හා මිළ දී ගැනීමේ කාර්යයෙහි යෙදී සිටිති. සංස්කෘතිය මිළ දී ගැනීමට අවශ්‍ය වන්නේ තරු පහේ හෝටල් ඇසුරු කරන්නන්ට පමණක් නො වේ. ගමෙන් නගරයට පැමිණ සාමාන්‍ය ජීවිතයක් ගතකරන මාස තුන හතරකට වරක් හෝ අවුරුද්දකට වරක් හෝ ගමට යන බොහෝ දෙනාට ද සංස්කෘතිය මිළ දී ගැනීමට අවශ්‍ය වෙයි. රතුහාලේ බත්, කැකුළු බත් අද බොහෝ ආපනශාලාවල විකිණීමට ඇත්තේ එහි ඇති ගුණය සළකා පමණක් නො වෙයි. ගැමි සංස්කෘතිය මිළ දී ගැනීමේ අවශ්‍යතාවක් අප බොහෝ දෙනාට වෙයි.

එහෙත් මෙහි දී යමකුට ඒ එසේ නොවේ යැයි ද අප කරන්නේ අපට යම් යම් අවශ්‍යතා යටතේ විඳින්නට බැරි දෙයක් හෝ හැඟීමක් වෙනත් කිසිවක් කරගත නොහැකි වූ කල මිළ දී ගැනීම හෝ වෙනත් අයුරකින් ලබාගැනීම යැයි ද කිවහැකි ය. එහි ඇත්තක් වෙයි. කුඩා කළ සිට හුරු පුරුදු වූ සංස්කෘතිය තමන්ගේ වත්මන් ජීවන රටාවට බාහිර වූ කල අර කුඩා කල හුරු පුරුදු වූ සංස්කෘතිය ජීවිතයට බාහිරව වුවත් ලබාගැනීමට ඇතැම්හු වෙහෙසෙති. එහි දී තම වත්මන් ජීවිතයට අදාළ නොවන දෑ ද ඔවුහු අනුගමනය කරති. එය සංස්කෘතිය මිළ දී ගැනීමක් ලෙස හැඳින්වීමට විරුද්ධ වුවන් සමග  එකඟ වීමට අවශ්‍ය වුවත් එසේ කිරීමට නොහැක්කේ එහි මිළ දී ගැනීමක් ඇති නිසාත් එදිනෙදා ජීවිතයෙහි දී කුඩා කළ හුරු පුරුදු වූ සංස්කෘතියෙන් බැහැරවීම නිසා ඒ පුරුදු සංස්කෘතිය ලබාගැනීමට ඇති අවශ්‍යතාව නිසා එළෙස කටයුතු කිරීමක් සිදුවන නිසාත් ය. මෙහි යම් ජාතිකත්ව හැඟීමක් ද වෙයි.

පෞද්ගලිකව එසේ සංස්කෘතිය මිළදී ගන්නා අතර දැනට සියවසකට අධික කාලයක් තිස්සේ සාමූහිකව ද අපි ඒ අයුරින් කටයුතු කරමු. අපේ බොහෝ පාසල් එයට කදිම උදාහරණයක් වෙයි. පාසලට ලන්දේසීන් අරක්ගත් සමයේ සිට ම එහි ඉගැන්වෙන්නේ මෙරටට සුදුසු දෑ නො වේ. ඉංගිරිසිහු ද ඒ තත්වය තව දුරටත් පවත්වා ගෙන යෑමට කටයුතු කළහ. අවාසනාවකට අප විසින් පිහිටුවනු ලැබූ පාසල්වල ද තත්වය එතරම් වෙනස් නො වී ය. ඒ පාසල්වල ද උගන්වනු ලැබුයේ ඉංගිරිසින් විසින් පිහිටුවන ලද පාසල්වල උගන්වන ලද විෂය නිර්දේශ ම විය. ඒ අතරට ඉංගිරිසින්ගේ (මිෂනාරීන්ගේ) පාසල්වලින් බැහැර කරනු ලැබූ සිංහල, බුද්ධදහම වැනි විෂය ද එක්කෙරිණි. ඒ එක් අතකින් ගත්කල සංස්කෘතිය මිළදී ගැනීමක් විය.

බෞද්ධයන් විසින් එලෙස පිහිටුවනු ලැබූ බොහෝ පාසල්වල උදෑසන පාසල ආරම්භයේ පන්සිල් ගැනීම හා පාසල අවසානයේ ගාථාවක් ශබ්ද නගා කීම සිදු කෙරිණි. එහෙත් ඒ අතර ඉගැන්වුණේ ක්‍රිස්තියානි විෂය නිර්දේශ ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ දැනුම අප මත බලයෙන් පැටවීමට පන්සිල් හා ගාථා අතර බෞද්ධයන් විසින් පිහිටුවනු ලැබූ පාසල්වල ද ජයට ම කෙරිණි. දැනුදු රජයේ බොහෝ පාසල්වල ඒ සිදු කෙරෙයි. ඒ එසේ නොකර බැරි යැයි කිසිවකු කීමට ඉඩ ඇත. අද ලෝකය බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට යට ව තිබිය දී ඊනියා රැකියා වෙළෙඳපොළ බටහිර අධ්‍යාපනය මත රැඳෙද්දී අපට කළහැක්කේ කුමක් ද යන ප්‍රශ්නය කිසිවකු අසනු ඇත.

දැනට ඒ අධ්‍යාපනය යම් ප්‍රමාණයකට ලබා දිය යුතු ය යන්න පැහැදිලි ය. එහෙත් ඒ අධ්‍යාපනයේ තරම අප සිසුන්ට කියා දිය යුතු ය. ඒ එකම අධ්‍යාපනය නොවන බව හා ඉන් ලැබෙන දැනුම එකම දැනුම නොවන බව සිසුන්ට ඉගැන්වීම වැදගත් ය. ඒ අතර වෙනත් දැනුම් ගැන විශේෂයෙන් ම අපේ දැනුම් ගැන සුළුවෙන් වුවත් සිසුන් දැනුවත් කළ යුතු ය. එසේ නොකර බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ දැනුම පන්සිල් හා ගාථා අතර බෙදාදීම අප ම රවටා ගැනීමකි. එහි දී සිදුවන්නේ ද එක්තරා ආකාරයකින් සංස්කෘතිය මිළදී ගැනීමකි.

© Prof. Nalin De Silva

අනෙක් පැත්තෙන් සිංහල හා බුදුදහම තවත් විෂය දෙකක් පමණක් බවට පත් වී ඇත. ඒ විෂය ද අපේ ජීවිතයෙන් බැහැර වී ඇත. අපි එහි දී ද සංස්කෘතිය මිළ දී ගන්නෙමු. පසුගිය දශක කිහිපයක් තිස්සේ සිංහල හා බුදුදහම තවත් විෂය දෙකක් පමණක් වීමේ ඵල විපාක අපි අද අත්විඳිමින් සිටින්නෙමු. අප සිංහල කතාකරන බව සැබෑ ය. එහෙත් අප සිංහල කතාකරන්නේ සිංහල සම්ප්‍රදායේ නොව ඉංගිරිසි සම්ප්‍රදායෙහි ය. අප මෙහි දී අවධානය යොමු කරන්නේ නිවේදක නිවේදිකාවන් විසින් තොර තෝංචියක් නැතිව භාවිතා කෙරෙන ඉංගිරිසි වචන ගැන පමණක් නො වේ. අප අද සිංහල කතාකරන්නේ ඉංගිරිසියෙනි. වෙනත් වචනවලින් කිවහොත් ඉංගිරිසි භාෂා යෙදුම් අපේ යෙදුම් බවට පත්වෙමින් ඇත.

එකල කිරි ගොවීහු මෙරට නො සිටියහ. එහෙත් අද එවැන්නෝ වෙති. අප මෙය කලින් ද සඳහන් කර ඇත. ගොවි යන වචනයෙහි නිරුක්තිය කෙසේ වුවත් මෙරට ගොවියෝ සතුන් ඇති කරන්නෝ නොවූහ. ඉංගිරිසි ෆාමර් යන්නෙහි සතුන් ඇතිකරන්නනන්ද අඩංගු නමුත් ඒ සිංහල සම්ප්‍රදාය නො වේ. අද ඉස්සන් ගොවියෝ මෙන් ම ඌරු ගොවියෝ ද සිටිති. මස් පිණිස සතුන් ඇතිකරන්නනන්ට ද ගොවියන් යැයි කීමෙන් ගොවියා යන්න බාල්දු කෙරී ඇත. සිංහල හා බුදුදහම තවත් විෂය දෙකක් පමණක් ලෙස උගත් අයට මෙහි ඇති බරපතළකම නො තේරෙයි.

දැන් දැන් මෙවැනි කිරිගොවි ගොන්කම් වැඩි වැඩියෙන් සිදුවුවත් කලකට පෙර ද ඒ තිබී ඇත. කෝච්චිය අල්ලනවා යනු කැච් ද ට්‍රේන් යන්නෙහි මෝඩ පරිවර්තනයක් පමණකි. එමෙන් ම අද ව්‍යවහාර වන  බස් එක ගන්නවා යන්න ටේක් ද බස් යන ඉංගිරිසි යෙදුමෙහි සෘජු පරිවර්තනයක් පමණකි. ඔබ රූපවාහිනිය නැරඹුවහොත් හෝ ගුවන්විදුලියට සවන් දුනහොත් හෝ මෙවැනි අමන යෙදුම් රාශියක් දැනගත හැකි වනු ඇත.

බටහිර ක්‍රිස්තියානි නූතනත්වය විසින් බුදුදහම තවත් විෂයක් බවට පත්කිරීමෙන් අපි තව තවත් ඕල්කට් බෞද්ධයන් බවට පත්වෙමින් සිටිමු. අප ජීවත්වන්නේ සිංහල බෞද්ධයන් ලෙස නොව ඊනියා ජාත්‍යන්තර බෞද්ධයන් ලෙස ය. ජාත්‍යන්තර බෞද්ධකම ජීවිතයත් සමඟ බද්ධ වී නැත. පෝයට සිල්ගැනීම නරක වැඩක් නො වේ. එහෙත් පෝය දෙකක් අතර ක්‍රිස්තියානි සංස්කෘතියක ජීවත්වෙමින් පෝයට සිල්ගැනීම සංස්කෘතිය මිළදී ගැනීමකි.

මෙය වඩාත් බලපාන්නේ පිටරට, විශේෂයෙන් ම බටහිර රටවල ජීවත්වන සිංහල බෞද්ධයනට ය. මුළුමනින් ම මෙන් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ජීවත්වන ඔවුන්ට තමන්ට ලංකාවේ පුරුදු වූ සංස්කෘතියෙන් (එහි කෙතරම් අඩුපාඩුකම් තිබුණ ද) යම් යම් දෑ අවශ්‍ය වෙයි. පුරුදු සංස්කෘතියෙන් බැහැර ව ජීවත්වන ඔවුන්ට ඒ පුරුදු සංස්කෘතිය මිළ දී ගැනීමට අවශ්‍ය වෙයි. ඔවුහු ඒ සඳහා විවිධ උත්සව සංවිධානය කරති. බටහිර රටවලට වැඩම කරන භික්ෂූන් වගන්සේ අතින් සිදුවන්නේ බටහිර ධර්මප්‍රචාරයක් නොව ඒ ඒ රටවලට ගොස් සිටින සිංහල බෞද්ධයන්ගේ හා ජාත්‍යන්තර බෞද්ධයන්ගේ සංස්කෘතික අවශ්‍යතා ඉටුකිරීම ය.

සංස්කෘතිය ඒ ආකාරයෙන් වුවත් පවත්වාගෙන යෑම වරදක් යැයි අපි නො කියමු. පෝයට පමණක් හෝ සිල් ගැනීම වැදගත් වෙයි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ විෂය මාලා ඉගැන්වීම  ආරම්භයේ දී පන්සිල් ගැනීම හා ඒ අවසානයේ දී ගාථා කීම වෙනත් කිසිවක් නොකර ඒ විෂය පමණක් ඉගෙනීමට වඩා වැදගත් ය. බුදුදහම විලයයක් ලෙස වුවත් ඉගෙනීම ද ඒ අයුරින් ම සැළකිය හැකි ය. පිටරට සිටින සිංහල හා ජාත්‍යන්තර බෞද්ධයන් විවිධ සංස්කෘතික උත්සව සංවිධානය කිරීම ද වැදගත් වෙයි. අඩුම තරමින් ඔවුන්ට තම දරුවන්ට සුළු වශයෙන් වුවත් සිංහල බෞද්ධ සංස්කෘතිය හඳුන්වාදීමේ අවස්ථාව ඉන් උදාවෙයි.

එහෙත් අප ඒ සියළු තැනක දී ම අප කරන්නේ කුමක් ද යන්න ගැන සතියකින් යුක්ත විය යුතු ය. එසේ නොවුවහොත් ඒ ආදේශික සංස්කෘතිය අපේ සංස්කෘතිය යැයි කල්යෑමේ දී සිතෙන්නට හැකියාවක් වෙයි. අද රූපවාහිනිය ඔස්සේ සංස්කෘතිය ගෙදරට ම ගෙනැවිත් දීමට කටයුතු කර ඇත. අපේ ගම රූපවාහිනියෙන් අද නැරඹිය හැක්කේ ඒ පිළිබඳ විවිධ උගතුන් විසින් කෙරෙන අර්ථකථන හා විච්චුරණ ද සමගින් ය. අප අපේ ගම නරඹා හෝ නරඹමින් හෝ ඇතැම් විට කඩෙන් ගෙනා චීනෙත් නැති චයිනීස් යනුවෙන් හැඳින්වෙන ආහාර අනුභව කරමු. ඇතැම් උගතකු ලොරියෙන් ගෙනගිය හැකි වට්ටක්කා ගෙඩියක් ගැන කියන කතා අසා ඕස්ට්‍රේලියාවෙන් ගෙන්වන ලද කුඩා ඇපල් ගෙඩියක් කමු.

© Prof. Nalin De Silva

ඇපල් නොකෑ යුතු බවක් මෙයින් නො කියැවෙයි. එහෙත් වට්ටක්කා ගෙඩිය සංස්කෘතික කයිවාරුවක් බවට පත්විය යුතු නො වෙයි.

සංස්කෘතිය මිළ දී ගැනීම හෙවත් ආදේශික සංස්කෘතියක් ගැන සැළකිලිමත්වීම මෙරටට පමණක් සීමාවූවක් නො වේ. සංස්කෘතිය අපෙන් වෙන්කළ විට සංසාකෘතිය මිළ දී ගැනීමක් සිදුවෙයි. බටහිර රටවල ද සංස්කෘතිය අළෙවි වෙයි. එහෙත් එහි වෙනසක් වෙයි. සංස්කෘතිය අළෙවිකිරීම යනු සංස්කෘතිය පුද්ගලයාගෙන් වෙන් කෙරුණු බටහිර ක්‍රිස්තියානි සංසාකෘතියෙහි ප්‍රතිඵලයක් වෙයි. බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංුස්කෘතියෙහි සංස්කෘතිය පුද්ගලයාගෙන් වෙන් කෙරී ඇත. බටහිරයන් සංස්කෘතිය මිළ්දී ගන්නේ එසේ පුද්ගලයාගෙන් සංස්කෘතිය වෙන් කෙරුණු සංස්කෘතියක ය. සංස්කෘතිය එලෙස වෙන්කිරීමත්, සංස්කෘතිය අළෙවි කිරීමත්, සංස්කෘතිය මිළ දී ගැනීමත් බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට  එකඟ ය.

එහෙත් අප සංස්කෘතිය වෙන්කරන්නේ අපේ සංස්කෘතියට එකඟ ව නො වෙයි. අපේ සංස්කෘතියෙහි සංස්කෘතිය පුද්ගලයාගෙන් වෙන්වූවක් නො වේ. අප අපේ සංස්කෘතිය අපෙන් වෙන්කරන්නේ බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ය. මෙහි ප්‍රතිඵලය වන්නේ අප අපේ සංස්කෘතියෙන් ක්‍රමයෙන් ඈත්වීම ය. බටහිරයෝ සංස්කෘතිය එලෙස වෙන්කිරීමෙන් තම සංස්කෘතියෙන් ඈත් නො වෙති. ඔවුන් සංස්කෘතිය පුද්ගලයන්ගෙන් වෙන්කරන්නේ ඔවුන්ගේ සංස්කෘතියෙහි ම ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva